# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/8 - 2020 මාර්තු මස 02 වැනි සඳුදා - 2020.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/1/2/3.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ (2)(ඇ) අනුව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, මේ ප්‍රකාශනයෙන් -

(අ) අද දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හරින අතර, අභිනව පාර්ලිමේන්තුව වර්ෂ දෙදහස් විස්සක් වූ මැයි මස දහහතර වැනි දින රැස්වීම සඳහා කැඳවන බව ;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගන්නා දිනය වශයෙන් වර්ෂ දෙදහස් විස්සක් වූ අප්‍රේල් මස විසිපස් වැනි දිනය නියම කරන බව ;

(ඇ) තේරීම් භාර නිලධරයන් විසින් නාමයෝජනා පත්‍ර භාර ගතයුතු වන්නේ යම් කාලසීමාවක් ඇතුළත ද, ඒ නාමයෝජනා කාලසීමාව වශයෙන් වර්ෂ දෙදහස් විස්සක් වූ මාර්තු මස දොළොස් වන දිනයෙන් ආරම්භව වර්ෂ දෙදහස් විස්සක් වූ මාර්තු මස දහනව වන දින දහවල් දොළහට අවසන් වන කාලසීමාව නියම කරන බව ; සහ

(ඈ) මෙහි උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් කර ඇත්තා වූ මැතිවරණ කොට්ඨාසය සඳහා තේරී පත්වීමට අපේක්ෂා කරන මන්ත්‍රී ධූරාපේක්ෂකයන්ගේ නාමයෝජනා කරනු ලැබිය යුතු එක් එක් ස්ථානය වශයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානය නියම කරන බව ;

මෙයින් සියල්ලෝම දැනගත යුතුය.

වර්ෂ දෙදහස් විස්සක් වූ මාර්තු මස 02 වන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. ජයසුන්දර,

ජනාධිපති ලේකම්.

## උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මැතිවරණ කොට්ඨාසය* | *නාමයෝජනා කරනු ලැබිය යුතු ස්ථානය* |
| අංක 01 - කොළඹ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ |
| අංක 02 - ගම්පහ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ |
| අංක 03 - කළුතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර |
| අංක 04 - මහනුවර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර |
| අංක 05 - මාතලේ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ |
| අංක 06 - නුවරඑළිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය |
| අංක 07 - ගාල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල |
| අංක 08 - මාතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර |
| අංක 09 - හම්බන්තොට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට |
| අංක 10 - යාපනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය |
| අංක 11 - වන්නි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව |
| අංක 12 - මඩකලපුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව |
| අංක 13 - දිගාමඩුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර |
| අංක 14 - ත්‍රිකුණාමලය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය |
| අංක 15 - කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල |
| අංක 16 - පුත්තලම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම |
| අංක 17 - අනුරාධපුරය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය |
| අංක 18 - පොළොන්නරුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව |
| අංක 19 - බදුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල |
| අංක 20 - මොණරාගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල |
| අංක 21 - රත්නපුර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර |
| අංක 22 - කෑගල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.